# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: NPD/RD/DCB2021/Circular
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021.01.11

චක්‍රලේඛ : MF/NPD/ 01/2021

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**විමධ්‍යගත අයවැය වැඩසටහන - 2021**

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ග්‍රාමීය සංවර්ධනය තුළින් ප්‍රාදේශීය විෂමතා අවම කරමින් රට සංවර්ධනය කිරීමට අරමුණු කර ඇති අතර ජනතා කේන්ද්‍රීය ආර්ථිකය බිහිකිරීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂිතය. එම ඉලක්කයන් සපුරා ගැනීමේ ජාතික කර්තව්‍යයට දායකවීමේ අරමුණ ඇතිව 2021 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

2021 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වෙනුවෙන් රුපියල් මිලියන 10 ක ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයේ, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ ලබාදීමට තීරණය කර තිබේ. මෙම අමාත්‍යාංශය සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා හා වෙනත් ආයතන මගින් ප්‍රතිපාදන සලසා නොමැති ආර්ථික, සමාජීය, ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය භෞතික යටිතල පහසුකම් ඇති කිරීම හෝ වැඩිදියුණු කිරීම මෙන්ම සමාජ සුභසාධනය ඉලක්ක කර ගත් ව්‍යාපෘති සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන නිසි පරිදි ආයෝජනය කරන බවට වග බලා ගැනීම ඔබගේ වගකීමකි.

විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම පහසු කිරීම උදෙසා පහත සඳහන් මාර්ගෝපදේශයන් නිකුත් කෙරේ. **2021 මාර්තු 31** වන විට පහත සඳහන් අංශ යටතේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති යෝජනා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙතින් ලබාගෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමතිය සහිතව ඔබගේ නිර්දේශයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතු වේ.

**1.ව්‍යාපෘති තෝරා ගැනීම**

**1.1** ග්‍රාමීය ප්‍රජා පානීය ජල සම්පාදන ව්‍යාපෘති

**1.2** කුඩා ප්‍රමාණයේ ග්‍රාමීය විදුලි ව්‍යාපෘති/සුළු පරිමාන විදුලිය දීර්ඝ කිරීම් (මෙම ව්‍යාපෘති 2021 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කර අවසන් කළ හැකි බවට ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය සහතික විය යුතුය.)

**1.3** පළාත් මාර්ග, ග්‍රාමීය මාර්ග,අඩි පාරවල්, පියගැටපෙලවල්, පාලම්, බෝක්කු, ඒදඬු, කම්බි පාලම්, මාර්ග දෙපස කාණු පද්ධති වැනි ග්‍රාමීය ගමනා ගමන පහසුකම් සම්පාදන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති.

**1.4** නිෂ්පාදනයන්ට වැඩි වටිනාකමක් /වැඩි මිලක් ලබා දෙන ආර්ථික කටයුතු වැඩි දියුණු කිරීමට ඉවහල් වන කඩමණ්ඩි/සතිපොළ /අලවි මධ්‍යස්ථානවල භෞතික යටිතල පහසුකම් ඇති කිරීම / නවීකරණය කිරීම හා ඒවාට අදාල සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම /වැඩිදියුණු කිරීම.

**1.5** ප්‍රාථමික හා ද්විතික පාසල්, ග්‍රාමීය බෙහෙත් ශාලා (dispensary) සහ මාතෘ හා ළමා සායනයන්හි භෞතික යටිතල පහසුකම් ඇති කිරීම හෝ වැඩිදියුණු කිරීම / භාණ්ඩ සැපයීම, ඒවාට අදාල ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම.

**1.6** ග්‍රාමීය ක්‍රීඩා පිටි සහ පුස්තකාල සඳහා පහසුකම් ඇති කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති.

**1.7** සුළු වාරිමාර්ග යටතේ කුඩා වැව්, ඇලවේලි, අමුණු, ජලබස්නා ස්ථාන සහ ජල පොකුණු, වගා ළිං, නළ ළිං ඉදි කිරීම සහ ප්‍රතිසංස්කරණය.

**1.8** ලියාපදිංචි සමිති / ප්‍රජාමූල සංවිධාන, පෙර පාසල්, ළමා නිවාස සහ වැඩිහිටි නිවාස සඳහා පහසුකම් සම්පාදනය / උපකරණ සැපයීම.

**1.9** ලියාපදිංචි දහම් පාසල්, ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා පහසුකම් සම්පාදනය/ උපකරණ සැපයීම සහ සුසාන භූමි ප්‍රතිසංස්කරණය කිරීම.

**1.10** වන සතුන්ගෙන් ජනාවාසවලට එල්ලවන උවදුරු දුරු කිරීම හො අවම කිරීම සඳහා වන යෝජනා.

**1.11** ග්‍රාමීය ආර්ථිකය නැංවීම සඳහා ප්‍රාදේශිය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි යෝජනා.

**1.12** ප්‍රමුඛතාවය ලබා දිය යුතු යෝජිත නිර්නායකයන්ට අනුකූල වෙනත් යෝජනා.

**2.පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ ප්‍රතිපාදන බෙදීයන ආකාරය**

**2.1** එක් මන්ත්‍රීවරයකුගේ සම්පූර්ණ ප්‍රතිපාදනයෙන් 50% (රුපියල් මිලියන 5 ක්) ක අවමයක් භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති (ඉදිකිරීම්) සඳහා වෙන් කළ යුතුය.

**2.2** එක් ව්‍යාපෘතියක උපරිම වටිනාකම රු. මිලියන 2 කට සීමා විය යුතුය.

**2.3** ප්‍රතිපාදනයෙන් **20%** ක (රුපියල් මිලියන 2 ක්) උපරිමයක් දක්වා වටිනාකම රුපියල් 200,000/- ට අඩු ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැක.

**2.4** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතර ජනගහනය, දරිද්‍රතාවය සහ භූමි ප්‍රමාණය යන සාධක පදනම් කර ගෙන ප්‍රතිපාදන බෙදී යන පරිදි ව්‍යාපෘති යොජනා ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

**2.5** මෙම ප්‍රතිපාදන යටතේ පොදු කාර්යන් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු අතර එක් එක් පුද්ගලයන්ට හෝ පෞද්ගලික කටයුතු සඳහා ඍජු ප්‍රදාන ලබා නොදිය යුතුය.

3.ඉදිකිරීම් ව්‍යාපෘති

**3.1** ඉදි කිරීම හා අලුත් වැඩියා කිරීම සඳහා අරමුදල් වෙන් කිරීමට පෙර එම ඉදිකිරීම යෝජිත අරමුණ සඳහා අනාගතයේදී බාධාවකින් තොරව යොදා ගත හැකි බව හා නඩත්තු කටයුතු සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බවට දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශිය ලේකම් විසින් සහතික විය යුතුය.

**3.2** .ඉදිකිරීම් වැඩ සඳහා (ඉඩම් හිමිකම නිරවුල් කිරීම, සමිති ලියාපදිංචිය, සම්පත් අවශ්‍යතාවය, වෙනත් ආයතන වල එකඟතාය අවශ්‍ය නම් ලබා ගැනීම) ඇමුණුම් 1 හි දැක්වෙන පරිදි ප්‍රාදේශිය ලේකම් මගින් ශක්‍යතා වාර්තාවක් ලබා ගත යුතුය.

4.ක්‍රමවේදය

**4.1** සියළුම ව්‍යාපාති යෝජනා ඔබ වෙත ලැබුණු පසු සති 2 ක් ඇතුලත අදාල ප්‍රාදේශිය ලේකම් වෙත යොමු කර අදාල ව්‍යාපෘති යෝජනා 2021 වර්ෂය තුල ක්‍රියාත්මක කර අවසන් කල හැකි බවට සහතිකයක් ලබා ගත යුතුය.

**4.2** ජාතික ලයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් තම ව්‍යාපෘති යෝජනා අදාළ දිස්ත්‍රික්ලේකම්වරුන් වෙත ලබා දෙනු ඇත. ඔබ විසින් මෙමගින් ඉදිරිපත් කරනු ලැබු නිර්නායකයන්ට අනුකල ව්‍යාපෘති නිර්දේශ කර, අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තව වෙත යොමුකළ යුතු වේ.

**4.3** සියළුම ව්‍යාපෘති රජයේ අනුමත නීතිරීති, ප්‍රසම්පාදන මාර්ගෝපදේශය හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුය.

**4.4** ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ඔබ ඉදිරිපත් කරනු ලබන සියළුම ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය හා ප්‍රතිපාදන ලබාගත යුතුය.

5.වෙනත් කරුණු

**5.1** ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා එක් එක් ව්‍යාපෘතියේ වටිනාකමින් **3%** කට නොවැඩි ප්‍රතිපාදන පරිපාලන වියදම් ලෙස වෙන් කළ හැක. එසේම ඉදිකිරීමක් නොවන ව්‍යාපෘති සඳහා 1% කට නොවැඩි ප්‍රතිපාදනයක් පරිපාලන වියදම් ලෙස වෙන් කල හැක

**5.2** මෙම වැඩසටහන යටතේ 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් හඳුනාගත යුතුය. සියළුම ව්‍යාපෘති 2021 දී අවසන් කර සියළුම මුදල් ගෙවීම් සම්පූර්ණ කරන බවට දිස්ත්‍රික් ලේකම්වරුන් සහතික විය යුතුය. 2021 වර්ෂයෙන් ඉදිරියට ව්‍යාපෘති අව්ජ්ජේද කිරීම නොකළ යුතුය.

**5.3** විමධ්‍යගත අයවැය අරමුදල් යටතේ යෝජිත ව්‍යාපෘති යෝජනාවක් නොවැලැක්විය හැකි හේතුවක් මත හැර **2021 වර්ෂයේ සැප්තැම්බර් මස 30** වන දිනෙන් පසුව සංශෝධනය නොකළ යුතුය.

**5.4** විමධ්‍යගත අයවැය අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධ උපදෙස් හා මාර්ගෝපදේශ එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

5.5 පෙර වර්ෂ වලදී මෙන්ම මෙම වර්ෂයේදීත් විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ව්‍යාපෘති සකස් කිරීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය සහයෝගය ලබාදීම හා වැඩසටහන සම්බන්ධීකරණය කිරීම සඳහා දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලයට අනුයුක්ත නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් (සැලසුම්) දෙදෙනකු අනුයුක්ත කිරීමට කාරුණික වන්න.

5.6 විමධ්‍යගත අයවැය වැඩසටහන 2021 ට අදාල කාලරාමුව ඇතුලත් ක්‍රියාකාරී සැලැස්ම මේ සමග අමුණා ඇත. **(ඇමුණුම් 02)**

5.7 විමධ්‍යගත අයවැය වැඩසටහන 2021 මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට සිදුවන සියලුම බදු හා වෙනත් ගෙවීම් මෙම වැඩසටහන යටතේ ලබාදෙන ප්‍රතිපාදන මගින් ආවරණය කරගත යුතු අතර ඒ සඳහා අමතර ප්‍රතිපාදන හිමි නොවනු ඇත.

5.8 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා විසින් ලබාදෙන යෝජනා **ඇමුණුම්** අංක 03 ආකෘතිය මගින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

එසේම මෙම චක්‍රලේඛයේ අන්තර්ගතය පිළිබඳ ඔබගේ දිස්ත්‍රික්කයේ සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

**එස්.ආර්.ආටිගල**
ලේකම්

පිටපත් -

1. සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා - කාරුණික දැන ගැනීම පිණිස හා හඳුනාගත් ව්‍යාපෘති යෝජනා - අදාල දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත 2021 මාර්තු මස 31 වන දිනට පෙර යොමු කිරීමට
2. ලේකම් - රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම පිණිස
3. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කාරුණික දැනගැනීම පිණිස
4. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම පිණිස
5. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
6. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
7. අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
8. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
9. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරු - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

## යෝජිත ඉදිකිරීම් ව්‍යාපෘති මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාව - 2021

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :
02. ග්‍රාම නිලධාරී වසමේ නම හා අංකය :
03. යෝජිත ව්‍යාපෘතියේ නම :
04. මෙම වැඩසටහන යටතේ වෙන් කිරීමට යෝජිත ප්‍රතිපාදන මුදල (රු). :
05. ව්‍යාපෘතියේ ස්වභාවය (√) යොදන්න:

I. සම්පූර්ණයෙන්ම නව ඉදිකිරීමකි ☐
II. නව ඉදිකිරීමකි (එක් කොටසක් වශයෙන්/එක් අදියරක් වශයෙන්) ☐
III. පවතින ව්‍යාපෘතියක කොටසකි ☐
IV. පවතින ව්‍යාපෘතියක අළුත්වැඩියාවකි / ප්‍රතිසංස්කරණයකි ☐

6. ඉහත අනු අංක 5. යටතේ හඳුනාගත් ව්‍යාපෘතිය පිළිබඳ පහත තොරතුරු සපයන්න

6.1. ව්‍යාපෘතිය සඳහා යෝජිත ඉඩම රජයට අයත්ද? ඔව්/නැත
නැති නම් රජයට පවරා දීමට යෝජිත ඉඩම නිරවුල් ද? ඔව්/නැත

ඉඩම නිරවුල් නම්, ඒ සඳහා අදාළ ඉඩමේ හිමිකාරීත්වය විසින් ලිඛිතව
එකඟතාවය ලබා දී තිබේ / එකඟතාවය ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත ඔව්/නැත

6.2. අදාළ ඉදිකිරීම සිදුකිරීමට විශේෂයෙන් පහත ආයතනයකින් හෝ ආයතන කිහිපයකින් එකඟතාවය ලබාගැනීම අවශ්‍ය නම්, ඒ බව සඳහන් කරන්න

| අනු. අංකය | ආයතනය | එකඟතාවය ලබාගත යුතු ද නැද්ද යන වග | අදාළ ආයතනයෙන් එකඟතාවය ලබාගත හැකිවේද? |
|---|---|---|---|
| 1 | මධ්‍යම පරිසර අධිකාරිය | ඔව්/නැත | ඔව්/නැත |
| 2 | භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය | ඔව්/නැත | ඔව්/නැත |
| 3 | වන සංරක්ෂණ දෙපාර්තමේනතුව | ඔව්/නැත | ඔව්/නැත |
| 4 | වන ජීවී දෙපාර්තමේනතුව | ඔව්/නැත | ඔව්/නැත |
| 5 | පළාත් පාලන ආයතනය ( සඳහන් කරන්න ) | ඔව්/නැත | ඔව්/නැත |
| 6 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ඔව්/නැත | ඔව්/නැත |
| 7 | විදුලිබල මණ්ඩලය | ඔව්/නැත | ඔව්/නැත |
| 8 | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ඔව්/නැත | ඔව්/නැත |
| 9 | වෙනත් (සඳහන් කරන්න ) | ඔව්/නැත | ඔව්/නැත |

7. පසුගිය වර්ෂවල සිදුකළ ආයෝජනයන් පිලිබඳ විස්තර

7.1. ආසන්න වර්ෂ 03 තුළ මෙම ව්‍යාපෘතියේ යෝජිත කාර්යයන් සඳහා
කිසියම් ආයතනයක් මුදල් ආයෝජනය කර තිබේද? ඔව්/නැත

ඔව් නම්, පහත සඳහන් ආකෘතිය සම්පූර්ණ කරන්න

| වර්ෂය | මුදල (රු.) | ආයෝජනය කළ ආයතනය | විශේෂ කරුණු (ඇත්නම්) |
|---|---|---|---|
| 2020 | | | |
| 2019 | | | |
| 2018 | | | |

7.2. එසේ නම් ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කර තිබේද? ඔව්/ නැත

**8. 2021 මුදල් ආයෝජන පිළිබඳ විස්තර**

8.1 මෙම ව්‍යාපෘතිය සඳහා මෙම වසරේ වෙනත් මූලාශ්‍රයකින් මුදල් වෙන් වී හෝ
වෙන් කිරීමට නියමිතව තිබේද? ඔව්/ නැත

8.2. ඉහත 8.1 යටතේ ඔව් නම් පහත තොරතුරු සපයන්න

| මූලාශ්‍රය | අමාත්‍යාංශය/ ආයතනය | ආවරණය වන වැඩ කොටස | මුදල (රු.) | එමගින් ව්‍යාපෘතිය සම්පූර්ණ කල හැකිද? |
|---|---|---|---|---|
| 1. | | | | ඔව්/නැත |
| 2. | | | | ඔව්/නැත |

8.3. යෝජිත ව්‍යාපෘතිය නිම කිරීමට යෝජනා කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් වේ. / ප්‍රමාණවත් නොවේ.

8.4. මෙම ආයෝජන මගින් ව්‍යාපෘතිය

i. සම්පූර්ණයෙන් නිම වේ /කොටසක් සම්පූර්ණ වේ / තවදුරටත් ඉදිරියේ දී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට රු.________________ ක ප්‍රතිපාදන (දළ වශයෙන්) යෙදවිය යුතුය.

8.5. සංවර්ධනය කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය දැනට හොඳ මට්ටමක පවතීද? ඔව්/නැත
ඒ අනුව, යෝජිත ප්‍රතිපාදනය වෙන් කළ යුතු **නොවේ / කල යුතු වේ.**

09. යෝජිත ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වන නිමවුම / ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිලිබඳ විස්තර

i. **මාර්ග ව්‍යාපෘතියක් නම්** අලුතින් වැඩි දියුණු කරන / අලුතින් ඉදි කෙරෙන දුර ප්‍රමාණය - (මීටර්/ කි.මී)................

ii. **කෘෂිකර්ම / වාරිමාර්ග ව්‍යාපෘතියක් නම්** දුර (මී/කි.මී)....... අලුතින් අස්වැද්දෙන බිම් ප්‍ර. (අක්).....

iii. ප්‍රතිලාභීන් සංඛ්‍යාව - පවුල්:--------- පුද්ගල - (ස්ත්‍රී):- --------- (පුරුෂ):- ---------

10. ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රජාවට සැලසෙන ප්‍රධාන ප්‍රතිලාභ සඳහන් කරන්න
i.
ii.
iii.

11. ප්‍රදේශයේ ග්‍රාමීය ප්‍රජා අවශ්‍යතා අතර මෙම ව්‍යාපෘතිය, අත්‍යාවශ්‍යයි/ අවශ්‍යයි/ ප්‍රමුඛ නැත/ අවශ්‍ය නැත

12. 2021 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය නිම කළ හැකිද? හැකිය/නොහැකිය

13. ඔව් නම් ඒ සඳහා ගත විය හැකි කාලය: - ............. සිට ................. දක්වා මාස / සති ................................

14. ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු

14.1. නිමවූ පසු නඩත්තුව බාරවන ආයතනය - ....................................... ....................................... ..........

14.2 නිමවූ පසු නඩත්තු වැඩ පිළිවලක් තිබේද ? විස්තර දක්වන්න - ....................................... ......................
....................................... ..................... ....................................... ...................... ................................

15. මෙම ව්‍යාපෘතිය පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකරන ලදී / සිදු නොකරන ලදී.

ඉහත තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

........................... දිනය:-
සංවර්ධන නිලධාරී/සංවර්ධන සහකාර,
ග්‍රාම නිලධාරී වසම (නම හා අංකය)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ව්‍යාපෘතිය 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට / නුසුදුසු බවට නිර්දේශ කරමි.

................................. දිනය:-
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
(මුද්‍රාව)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ව්‍යාපෘතිය 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට / නුසුදුසු බවට සහතික කරමි.

....................... දිනය:-
ප්‍රාදේශීය ලේකම්
(මුද්‍රාව)

ඇමුණුම 02

විමධ්‍යගත අයවැය වැඩසටහන 2021 - ක්‍රියාකාරී සැලැස්ම

| අනු අංකය | වැඩසටහන | ඉලක්කය | වගකීම |
|---|---|---|---|
| 01 | ගරු මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් ලේකම් වෙත යොමුකිරීම | **2021 මාර්තු 31** වන දිනට පෙර | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් |
| 02 | අදාල ව්‍යාපෘති යෝජනා 2021 වර්ෂය තුල ක්‍රියාත්මක කර අවසන් කල හැකි බවට සහතික වීම | ගරු මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් ලේකම් වෙත ලැබී සති 2 ක් තුල | දිස්ත්‍රික් ලේකම්,<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ.<br>ප්‍රාදේශිය ලේකම්.<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 03 | අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශය සහිතව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සංවර්ධන අංශය වෙත යොමු කිරීම | **2021 අප්‍රේල් 15** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්,<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 04 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම හා අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීම | සති දෙකක (2) කාලයක් ඇතුලත | අධ්‍යක්ෂ ජනරාල් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව |
| 05 | අනුමත කරනලද ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම | **2021 නොවැම්බර් මස 30** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්,<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ.<br>ප්‍රාදේශිය ලේකම්.<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 06 | ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්වල මාසික භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම | සති හා මාසික ප්‍රගති වාර්තා ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකිරීම | අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ.<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

ඇමුණුම - 3

# විමධ්‍යගත අයවැය වැඩසටහන - 2021

දිස්ත්‍රික්කය-

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ නම -

<table>
<tr><th rowspan="3">අ.අංකය</th><th rowspan="3">ප්‍රා.ලේ. කොට්ඨාශය</th><th rowspan="3">ව්‍යාපෘතියේ නම</th><th colspan="3">ඉදිකිරීම් ව්‍යාපෘති වටිනාකම අවම 50% (අවමය රු.මිලියන 5.0 )</th><th rowspan="3">4 සමාජ, ආර්ථික හා අධ්‍යාත්මික සංවර්ධනය ඉලක්ක කර ගත් පහසුකම් සැපයීම (මිලදී ගැනීම්) උපරිම 50% (උපරිමය රු මි. 5.0 )</th><th rowspan="3">3 + 4 (උපරිමය රු.මි. 10.0)</th></tr>
<tr><th>1</th><th>2</th><th>3</th></tr>
<tr><th>රු.. 200,000/- ට අඩු (උපරිමය රු . 2,000,000.00 දක්වා)</th><th>රු. 200,000/- ට වැඩි</th><th>ඉදි කිරීම් වල එකතුව (1 + 2)</th></tr>
<tr><td>1</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>2</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>3</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>4</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>5</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>6</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>7</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>8</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>9</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>10</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>11</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>12</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>13</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td colspan="3">එකතුව</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td colspan="3"></td><td>උපරිමය රු. 2,000,000.00</td><td></td><td>අවමය රු. 5,000,000.00</td><td>උපරිමය රු. 5,000,000.00</td><td>උපරිමය රු. 10,000,000.00</td></tr>
</table>